Article 12(1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 01-05-2018

පැමිණිලිකාරිය : එම්.ජී.එච්. රත්නායක මිය,
අංක 93/15, විහාර පාර, සුදුහුම්පොල,
මහනුවර.

වගඋත්තරකරුවන් : විදුහල්පති,
මහනුවර උසස් බාලිකා විද්‍යාලය,
මහනුවර.

**පැමිණිලි අංකය : HRC/K/45/17**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් 2017-01-17 වන දින සිය පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් සඳහන් කර ඇත්තේ තම දරුවා 2017 වසරේ මහ/උසස් බාලිකා විද්‍යාලයේ ප්‍රාථමික අංශයට ඇතුලත් කිරීමේ අරමුණින් ආසන්නතා පදනම යටතේ අයදුම් පත්‍රයක් යොමු කල බවත්, කැඳවීම් අංකය වීසී 413 යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී තමා ලකුණු 80ක් උපයාගත් බවත්ය. නමුත් තමාට තවත් ලකුණු 10ක් ලැබීමට සුදුසුකම් තිබියදී තමාට එම ලකුණු නොලැබුණු බවත්, සීතාදේවි බාලිකා විද්‍යාලයට ලකුණු 05ක්ද, හිමිකම් ඔප්පුවට ලකුණු 05ක්ද අහිමි වී කර ඇති බවත්ය. සීතාදේවි බාලිකා විද්‍යාලයට ලකුණු 05ක් අහිමි කිරීම නිසා තමාට එම ලකුණු 05 හිමි විය යුතු බවත්, ඔප්පුව ලකුණු 10ක් ලැබිය යුතු අතර, ඒ සඳහා ලකුණු 05ක් පමණක් ලබා දී ඇති බවත් සඳහන් කර ඇත. එම නිසා එම අහිමි කල ලකුණු 10ක් තමන් වෙත හිමිවිය යුතු බවට පැමිණිලිකරු විසින් ගරු කොමිෂන් සභාවට දන්වා ඇත. ඒ අනුව තම මුළු ලකුණු සීමාව ලකුණු 90 දක්වා වැඩි වන බවත්, පාසලට තෝරා ගැනීමේ අවම ලකුණු සීමාව ලකුණු 86ක් බවත්, පැමිණිලිකාරිය සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ දක්වා ඇත්තේ, මෙම පැමිණිලිකාරිය ආසන්නතා පදනම යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 80ක් උපයාගෙන ඇති බවත්, පාසලට ළමුන් ඇතුලත් කිරීමේ අවම ලකුණු සීමාව ලකුණු 86ක් වන බවත්ය. තවද වගඋත්තරකරු 2017-10-13 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රධාන කාර්යාලයේ පැවැති පරීක්ෂණයේදී සීතාදේවි විද්‍යාලය වෙනුවෙන් කපා ඇති ලකුණු 05 නැවත ලබා දීමක් කළ හැකි බවත්, නමුත් ආසන්නතා ගණය යටතේ දරුවන් පාසලට ඇතුලත් කර ගැනීමේ අවම ලකුණු සීමාව ලකුණු 86ක් බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකාරියගේ ඔප්පුව ලියාපදිංචි කර ඇත්තේ 2015 වසරේ බැවින්, ලකුණු 05ක් හිමි වන අතර, ඉතිරි ලකුණු 05 ලබා දීමට හැකියාවක් නොමැති බව වගඋත්තරකරුවන් කොමිෂන් සභාවට දන්වා ඇත.

ඒ අනුව ආසන්නතා පදනම යටතේ අවම ලකුණු සීමාව ඉක්මවා ගොස් නොමැති බැවින්, මෙම දරුවා පාසලට ඇතුලත් කර ගැනීමට නොහැකි බව වැඩිදුරටත් කොමිෂන් සභාව හමුවේ සඳහන් කර ඇත.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වූ කරුණු :-**

පැමිණිලිකාරිය ආසන්නා පදනම මත අංක විසි 413 යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 80ක් උපයාගෙන ඇති අතර, සීතාදේවි විද්‍යාලයට අහිමි කර ඇති ලකුණු 05 එකතු වීමත් සමග උපයාගත් ලකුණු 80 සිට ලකුණු 85 දක්වා ඉහළ යා යුතුව ඇත. තවද මෙම පැමිණිලිකාරියගේ ඔප්පුවට අදාළව 2007 වසරේ සිට බදු ගෙවන ලද කුවිතාන්සි කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති අතර, සුදුහුම්පොල රජමහා විහාරයට බදු ගෙවා 2007 වසරේ සිට නුවර බෞද්ධ කොමසාරිස් වෙතින් ඉල්ලීම් ඉදිරිපත් කළත්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේන් සිදු වී ඇති ප්‍රමාදය නිසා පැමිණිලිකාරියට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බව පැහැදිලි වේ.

ඒ අනුව පැමිණිලිකාරියට තවත් ලකුණු 05ක් ලබා දීමේ හැකියාවක් තිබෙන බවත්, ඒ අනුව පැමිණිලිකාරිය ලකුණු ප්‍රමාණය ලකුණු 90ක් දක්වා වැඩි වන අතර, එමගින් ආසන්නතා පදනම මත පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුලත් වීමේ අවස්ථාව හිමි වන බවත් කොමිෂන් සභාව හමුවේ කරුණු අනාවරණය වේ.

**නිගමනය :-**

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව පැමිණිලිකාරියට අසාධාරණයක් සිදු වී ඇති බවට නිරීක්ෂණය වන අතර එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව අනුව සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකාරියගේ දියණිය වන ධනිකා විලක්ෂි අලුත්ගේ 2018 වසරේ 02 වන වසරට ඇතුලත් කර ගැනීමට කටයුතු කළයුතු බවට වගඋත්තරකරු වෙත නිර්දේශ කරනු ලැබේ.

මෙම නිර්දේශය වහාම ක්‍රියාත්මක කර 2018.06.01 වන දිනට පෙර වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වා සිටිමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මැල් මාවත,
කොළඹ 04.

පිටපත :- ලේකම්
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය, බත්තරමුල්ල

B/R-7